# සීතාවක පුරාණ නගරය



මෙම නගරයට සීතාවක යන නම භාවිතා වී ඇත්තේ මෑතදී විය හැකියි. 16 වැනි සියවසට පෙර "සීතාවක නම භාවිතා වූ තැනක් නොදනිමි. එහෙත් "මායාදුනු පුර" යන නම පැරණි බවක් පෙනේ. "දුනු" යන පදයෙන් "දිනූ" (උපන්) යන්න අදහස් වෙයි. එමෙන්ම ජයගත් යන අදහසද එහි ඇත. මහයා කෙනෙකු උපන් හෝ ජයගත් නුවර "මායාදුනු පුර" වූ බව පැහැදිලිය මායා දුන්න වූයේ පසුවය මහාදිපාද හෙවත් මහ ඈපා මහයායි. සිංහල සිරිත අනුව කෙනෙකු රජකමට පත්වන්නේ ඈපා (ආදිපාද) මහයා (මහාදීපාද) තනතුරු ඉසිලීමෙන් පසුවය. ත්‍රි සිංහලයේ මහයාගේරට මායා රටයි.

"අයි පය මහ පය සිරි වින්දැ පිළිවෙල් සෙරජ්වැ
මිණි වොටිනෙන් පැහැයු"

"අභය ගිරි ii ලිපිය"

"දෙව්ගොන් රැජින කුස ඉපිද ඈපා මහයා සිරි
වින්දැ පිළිවෙල සෙයි රජ්වැ"

"මිහින්තලා ලිපිය"

දසවන සියවසට පමණ අයත් ලිපි රැසකම ඉහත සඳහන් සෙල්ලිපි පාඨය ඇතුළත්ය සීතාවක උපන් හෝ ජයගත් මහයා කවරෙක්දැයි නිශ්චිත සඳහනක් නැත. සීතාවකට නුදුරු තිඹිරිපල රජකුගේ තිඹිරිගෙය තබු ගම හැටියට ද සැලකේ. එහෙත් එහි උපන් මහයා කවරෙක් ද? මහනියම්ගම නමින් හැඳින්වෙන්නේද මහයාගේ නියම්ගම විය යුතුයි. රජ මාලිගාව වූයේ ද මේ ගමේය. මහ පැරකුම් බාහු මානාභරණ යුගයේදී රුහුණට සෙනෙවි වරු සිව් දෙනකු යවා ඇත.

ඉන් එක් සෙනෙවියකු මහා නියාම ප්‍රදේශය භාරව යැවූ බව චූල වංශයේ සඳහන් වෙයි. මේ මහා නියාමය මහ නියම් ගමයි. මායා ගේහ නම් සෙනෙවියකු ගැනද මෙකල සඳහනක් ඇත. සීතාවකත් මායා දුනු පෙදෙසත් මානියම්ගම් ගමත් එකම පෙදෙසක් සේ සැලකීම වැරදි නැත.

16 වැනි සියවස මුලදී වූ විජයබා කොල්ලයෙන් පසු භුවනෙකබාහු කෝට්ටේ රජ විය. මායා දුනු පුරයට පැන ආ සිරි විජය බා කුමරු (ගණේගොඩ යාදින්න අනුව) මායාදුනු රජු විය. රයිගමට ගිය කුමරු රයිගම් බණ්ඩාර විය. කලින් සිට දැනසිටි පලපුරුදු ප්‍රදේශ බැවින් ඔවුන් මෙසේ පලා එන්නට ඇත.

i වන රාජසිංහ රජ සමයේ සීතාවක නගරය පැවතුණු අන්දම පිළිබද ප්‍රමාණවත් අවබෝධයක් සැවුල් සන්දේශය ඇසුරෙන් ලද හැකිය. දෙව් විමනක් රජ විමනත් අතරින් සීතාවක නදිය ගැලුවාය. දෙව් විමණ තල්දුවේ පිහිටි බිරාඬි දෙවොලයි. රජ විමන මානියම්ග ම (වර්තමාන බණ්ඩාර වත්තේ) රජ මාලිග ාවයි.

"සව් සිරි පිරි එපුර වරඟනගෙ මන නඳ
දෙව් රජ විමන් තන යුග'තුරෙහි ගිලි සොඳ
එව් නිල වසාරොද ගඟිනේතෙරව පැහැද
දෙව් විමනත රඟ වහසල තුළට වැඳ"

දෙව් විමනේ නැටුම් ශාලාවට ඇතුල් වීමට සැවුලාට උපදෙස් ලද අයුරුයි ඒ. හෙරව (බිරාඬි) දෙවොල ඒ වන විට සම්පූර්ණයෙන් ගොඩ නගා තුබුණි. එහි රාම රාවණා යුද්ධය මහා භාරත යුද්ධය ද ස්කන්ධ පුරාණයද විෂ්ණු කළ අසුර යුද්ධය ද ඇඳ තුබුනේය.

"දියරම් රවුම් යුධ මහ බාරත යුද ද
මනරම් කඳ පොරණ හර කළ දිත් යුදද
ඇති හිමි කොට ඇඳි සිතියම් රූ නොමද
නොව හිමි සතොස පිරිලෙන් දැකගොස් සබඳ"

හෙරව දෙවොල් රැඟුම් පුද හා සිතියම් නරඹා ඉක්බිති හරඟන විමනට යන ලෙස සැවුලා උපදෙස් ලබයි. ඒ අනුව හරඟන විමනත් හෙරව දෙවොලක් ආයතන දෙකක් මෙන් ඇඟේ.

තල්දූව පසුකොට මඳ දුරක් ගියවිට දකුණු පස පෙදෙස කිරි අම්මලා කන්දයි, වම් පසින් ගොලෑ බොක්කයි. වීර සුන්දර බණ්ඩාරට වලගම වට්ටාරම දෙන ව්‍යාජයෙන් සීතාවකට ගෙන්වා ගොලෑබොක්කේ බොරු වලක දමා මැරවූ බව ජන වහරයි. තව ටික දුරක් යනවිට වැලි විටියයි. උඩරටින් පැරදි ආපසු එන රාජසිංහ රජුට පෙතංගොඩ උයනේදී උන කටුවක් ඇනී අසාධ්‍ය විය. කරවනැල්ල හරහා සීතාවකට එනවිට කරවනැල්ලේ දී කොරවුනු බව කියැවේ. (රජු කොරවුන ඇල්ල) කරවනැල්ල වූ බව ගැමියෝ කියති.

රජ විමනේ පැවති තත්වයද කවියා විස්තර කරයි. තුඟු ගනරන් ටැම්, දැව, පේකඩ, කටහන් රූ, බිතු සිතුවම්, රන් කොත්, උඩු වියන් අවට සැදී සුදු තිර පහන් වරට අංගෝපාංග වලින් මාලිගයේ පැවති ක්‍රමවත් භාවය පැහැදිලි වේ. (69-74 පද්‍ය) පසන් සභා මඩුවෙහි රජු සිහිසුන් අරා සිටිවිට රජසබේ පෙරෙවි බමුණන් අධිකරණ හා රජනීකි දත් ඇමතිවරු, වාසල මුකවෙට්ටි වරු, ප්‍රදේශ නායකයන්, මලල දෙලුවර සෙනග සිටු සෙනෙවි ඈපා මාපාවරු, වන්නිවරු හා වන්දින්ද රැස්වූ බව කියැවේ. (77-88 පද්‍ය) රාජසිංහ ගේ මරණයෙන් පසු මේ රජ මාලිගයත් හෙරව කෝවිලත් පරංගිත් අතින් විනාශ වූ බව චූල වංශයේ සඳහන් වෙයි.

අද අවිස්සාවේල්ල නගරයේ උසාවි සංකීර්ණය පිහිටි බිමේම එදා මෙපුර වීදියේ අධිකරණ විමසූ මහ පාය පැවති බව සිතා ගත හැකිය. එතැනින් මගුල් මහ වීදියේ සිට ගැටහැති ඇලට සමාන්තරව මහ මඟක් ගැටහැත්තේ කඩවත දක්වාත් එතැන් සිට සබරගමුව දක්වාත් පැවති බව සඳහන් වේ. මේ මග අසල වසුවිල් විට මහ මඩම තුබුණි.

සවිපුල් විකුම් සිහ මහමැති තුමා සොඳ
හරසෙල් එකතුල් කර කරවූ පබ ඳ
වසුවිල් විටෙහි මහ මඩද දැක සුබ ඳ
සිතැලොල් වඩා නුඹ නැගෙමින් යව සබ ඳ

වසුවිල් විට මහ මඩම විශේෂයෙන් අවධානය යොමුවිය යුතු තැනකි. අද ගලපිට මඩම නමින් හැඳින්වෙන්නේ මේ ස්ථානයයි. ආරාධනා කන්දට දකුණු දෙසින් ගැටහැති ඔය අසබඩ පිහිටා ඇත. වසු විල (පසුවිල) එදා ගවයන් ලැගි ජල බිමක් විය හැකියි. වසුවිල - අවසුවිල වී පසුව අවිස්සාවේල්ල වන්නට ඇතැයි සිතිය හැකිය. මෙතැනින් වම්පස මතඟ කැල සිටි ඇත්හල විය. අදත් මේ හරිය ඇත් පංතිය නමින් හැඳින්වේ. ඊලඟට සැවුළාට හමු වන්නේ ගැටහැත්තේ කඩවතයි. එහි හමුදාවක් රැකවරණයේ යෙදී සිටිබව සැවුල් සන්දේශයේ කියැවේ. ගැටහැති ඔය ඉහළ පෙදෙසේ දෙයියාගල, මුරුතැන්ගල, හේවායින්න කන්ද වැනි ඓතිහාසික ගම් හමු වේ. සීතාවක සිට ගැටහැත්ත දක්වා එකල වූ මහා මාර්ගයේ දෙපස කොස් ගස් වවා තුබුණු බවට ශාක්ෂි ඇත. එදා රජුට වරකා සැපයූ පැණි වරකාවද මේ අතර වෙයි. මේ මග දෙපස තැනින් තැන දක්නා ලැබෙන හතරැස් උස් පස් ගොඩැලි මුර කුටි තුබුණු තැන් විය හැකිය.

පුරාණ සීතාවක නගරයේ තවත් කොටසක් ඇත්තේ තල්දූව ගමේය. තෙල්දූව තල්දූව වූ බව පිළිගැනේ. මහනුවර විෂ්ණු දේවාලයේ රාජකාරී කටයුතු සඳහා පොල්තෙල් කොප්පරා ආදිය සැපයූ ගම තල්දූවයි. එය අදත් දේවාල ගමකි. දේවාලයේ සියළුම රාජකාරී කටයුතු සඳහා කැපවූ පරම්පරාවලට නියම කොට දුන් ඉඩම් තල්දූව කඹුරාපොල ආදී ගම්වල ඇත. ඉර හඳ කෙටූ පැරණි විහාර ලෙණක් කඹුරාපොල ගණේවත්තේ ඇත.

තල්දූව දූපත් වලින් සෑදුණු ගමකි. ගැටහැති ඔයත් සීතාවක නදියත් එක්වන මේ පෙදෙස නිතර ගං වතුරට යට වේ. සීතාවක නදියට වඩා ප්‍රබලව ගැටහැති ඔය ගැලූ ඈත අවධියක ගැටහැති ඔයේ ගෙන ආ මැණික් ඉල්ලම් සහිත අවසාදිත තැන්පත් වී පහළ තල්දූවට මැණික් පහළ වන්නට ඇත. ගුරු පස් ගොඩට ඉහළ දි සීතාවක නදිය දෙපස මැණික් ඉල්ලම් නැත. එසේ නම් ගැටහැති ඔය ඈත අවධියක දී කෝවිල් බිමද පසුකොට උතුරට ගලා විත ගුරු පස්ගොඩ හරියේදී හැරී තල්දූවේ උස් බිම් වට කරමින් ගලා යන්නට ඇතැයි සිතමි.

තල්දූවේ පිහිටි දූපත් කවරේදැයි විමසා බලමු. හෙරව කෝවිල පිහිටි බිම එකකි. අද සෝමාරාමය පවතින බිමත් මලුව පිට වත්තත් තවත් දූපතකි. ගණ පංතියද මී ගහ ගොඩැල්ලද දූපත්ය. තල්දූව නගරය පිහිටයේ අංගං පිටිය ගොඩ වත්තේය. එදා යුද සරඹ දැක්වූයේ මෙහි විය හැකිය. පැරණි මුස්ලිම් වෛද්‍ය පරම්පරාවේ ඉඩමද ගොඩ වත්තකි. රාජ සේකර දූවේගොඩ රණසිංහ මුදියන්සේ නම් වූ මුස්ලිම් වෛද්‍ය පරපුරට අයත් දූවේගො ාඩ වත්ත මිස අන් තැනක් නොවේ. තල්දූවෙන් ඇපලපටිය ගුරුගල්ල පාර ආශ්‍රිතව ගොස් යාලේගම නාපාවල, කපුවැල්ල, දයිගල හරහා රුවන්වැල්ලට පැරණි මාවත වැටී තුබුණි. තල්දූව සති වෙළඳපලට වම් පසින් ගණ පංතියේ එදා භික්ෂූන් වහන්සේලා වැඩ ඉන්නට ඇත. තැපැල් කාර්යාලය අසල වලව් වත්ත ප්‍රභූවරයකුගේ වලව්වක් තුබුණු බිමයි. මුස්ලිම් පල්ලිය පිහිටි බිම කුස්සිය මුල්ල වත්තයි.

තල්දූව පසුකොට මඳ දුරක් ගියවිට දකුණු පස පෙදෙස කිරි අම්මලා කන්දයි, වම් පසින් ගොලෑ බොක්කයි. වීර සුන්දර බණ්ඩාරට වලගම වට්ටාරම දෙන ව්‍යාජයෙන් සීතාවකට ගෙන්වා ගොලෑබොක්කේ බොරු වලක දමා මැරවූ බව ජන වහරයි. තව ටික දුරක් යනවිට වැලි විටියයි. උඩරටින් පැරදි ආපසු එන රාජසිංහ රජුට පෙතංගොඩ උයනේදී උන කටුවක් ඇනී අසාධ්‍ය විය. කරවනැල්ල හරහා සීතාවකට එනවිට කරවනැල්ලේ දී කොරවුනු බව කියැවේ. (රජු කොරවුන ඇල්ල) කරවනැල්ල වූ බව ගැමියෝ කියති. ආපසු කැළණි ගඟ දිගේම පහළට අඟුලෙන් විත් යලි සීතාවක නදිය දිගේ ඉහළට එමින් සිටියදී කිකිළි බිත්තර වැල්ලේදී රජු මිය ගියේ ය. ගඟේ සිට ඇල මගක් දිගේ අඟුල පිටින්ම රාජදේහය පාකරගෙන විත් දෝනාවක් තුළට දමා අවසන් කටයුතු කළබන ගැමියන්ගේ විශ්වාසයයි. මෙම සොහොන් බිම අද වැලිවිටිය හරියේ සොයාගෙ න ඇත. රාජ දේහයට අත තැබීමට සුදුසු රාජකීයයකු නොසිටියෙත් මෙසේ අප්‍රසිද්ධව අවසන් කටයුතු නිම කළ බව කියැවේ.

ආඩි ගුරුවරුන් ගඟ හරස් කළ පස් ගොඩ ගුරු පස්ගොඩ විය හැකිය. මේ හරියේ ගඟට සමාන්තරව ගොඩ කළ වැටියක ලක්‍ෂණ ගං ඉවුර දිගේ පෙනේ. ගං වතුර ගැලූ විට ගඟ මෙතැනින් හැරී ගැට හැති ඔයේ එන ජලයක් සමඟ තල්දූව නගරය මැදින් ගොස් ගොලෑ බොක්කේදී නැවත ගඟට එක් වෙයි. මෙසේ අවිස්සාවේල්ල, මානියම්ගම, තල්දූව, මදොළ යන ගම් එදා සීතාවක නගරයට ඇතුළත්ව තුබුණු බව පැහැදිලිවේ. තැලුම්පිටිය දිවුරුම් පිටිය වැනි ගම් වලදී වැරදි කරුවන්ට දඬුවම් පැමිණවූ බවද විශ්වාස කෙරේ.



ශාස්ත්‍රවේදී
නා. ලි. සාර්ලිස් අමරසිරි

